**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2023**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 132 ඡේදය ප්‍රකාරව අරමුදලේ වත්කම්, වගකීම් ආදායම් හා වියදම් සම්බන්ධයෙන් අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී අදාළ ගිණුම් කරන ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුදුපුත් මාපිය උපහාර නිවාස ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය වෙනුවෙන් දොළොස් නමකට හා 2023 වර්ෂය වෙනුවෙන් එක් නමකට වශයෙන් හාමුදුරුවරු දහතුන් නමකට ගෙවිය යුතු දෙවන වාරිකය රු.1,300,000ක් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම රු.100,000ක් සහ වගකීම් රු.1,300,000ක් අඩුවෙන් දැක්වුණු අතර, සමුච්චිත අරමුදල රු.1,200,000කින් වැඩියෙන් දැක්වුණි. | නිවාස ව්‍යාපෘතියේ පළමු අදියර වශයෙන් ලබා දුන් රුපියල් ලක්ෂයක මුදලින් වැඩ නිමකර ඇති බව හා තවදුරටත් බුද්ධශාසනයේ රැඳී සිටින බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් බවට සහතික වීමෙන් අනතුරුව දෙවන වාරිකය ඉල්ලුම් කළහොත් පමණක් ගෙවීම් කරනු ලැබේ. ඒ අනුව දෙවන වාරිකය අනිවාර්යෙන්ම ගෙවිය යුතු යැයි බැඳිමක් නොවන බැවින් ගිණුම්වල ගෙවිය යුතු ලෙස පෙන්නුම් නොකරන ලද බව දන්වා තිබුණි. | වාරික දෙකකින් ගෙවීමට සැලසුම් කර ඇති අවස්ථාවක ඊට අදාළව ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අලෙවිය සඳහා වන කඩදාසි වලින් සකස් කරන ලද දහම් පාසල් කොඩි සහ ස්ටිකර් තොගයත්, රු.711,300ක් වටිනාකමැති රෙදි කොඩි 2371ක ප්‍රමාණයත් මූල්‍ය ප්‍රකාශන වල තොග යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද වර්ෂය තුළ අලෙවි කර තිබූ රෙදි කොඩිවල | මේ සම්බන්ධයෙන් ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලා දැනුවත් කළද ඉතිරි කොඩි ආපසු භාර නොදීම නිසා නිශ්චිත වටිනාකමක් සඳහන් කිරීමට අපොහොසත් වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම පෙන්නුම් කිරීමට නොහැකි වූ අතර විධායක සභාව සමඟ සාකච්ඡා කොට තීරණයකට එළඹීමට සටහන් කර ගත් අතර | අදාළ කොඩි තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වටිනාකම වූ රු.90,300ක් වර්ෂයේ ආදායමට ඇතුළත් කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට ගැළපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දැක්වුණි. | වසර ගණනකට ඉහතදී පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත මුද්‍රණය කර හිටපු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ විසින් භාරදි තිබූ මෙම කොඩි සමාලෝචිත වර්ෂයේදි මුද්‍රණය කරන ලද කොඩි නොවන බැවින් සමුච්චිත අරමුදලට ගැලපීම් කරන ලදි. |

## 1.5.3. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ, 07 (1)(අ)උපවගන්තිය | සාමාජිකයින් විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් අදාළ වන රීති සකස් කර ගෙන සාමාජික ගාස්තු හා දායක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් අරමුදල සඳහා නිශ්චිත ආදායම් මාර්ගයක් නොතිබුණි. | සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල සමාජිකයින්ගේ සමාජික මුදල් අයකිරීමක් සිදු නොකරන බව දන්වමි. | රීති සකස් කර සාමාජික ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රීති මාලාවේ 7.1 වන ඡේදය | වසරකට මහා සභා රැස්වීම් 04ක් සහ විධායක රැස්වීම් 12ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් 03ක් සහ විධායක රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | රටේ පැවති අර්බුදකාරී තත්ත්වයන් යටතේ රැස්වීම් පැවැත්වීම නියමිත පරිදි සිදු නොකර අත්‍යවශ්‍ය කරුණු වලදි මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පවත්වන ලදී. මේ වන විට සාමාන්‍ය පරිදි අදාළ රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව අදාළ රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,346,577ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,907,854 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,438,723 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන පොළී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ, 6 වගන්තියේ (ඊ) උප වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන නිලධාරීන් හා සේවකයින් පත්කිරීම මෙන්ම සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබීම, අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අයහපත් බලපෑමක් ඇති කර තිබුණු බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව නව විධායක මණ්ඩලය නැවත වතාවක් දැනුවත් කිරීමට සටහන් කර ගතිමි. | අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කිරීමට හා සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන් 15ක් පරිත්‍යාග මඟින් ඉටු කර ගැනීමට සැලසුම් කර තිබුණ ද, පරිත්‍යාග ලබා ගැනීමේ කිසිදු වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර පෙර වර්ෂයන්හි තත්ත්වය ද මේ ආකාර විය. | දැනට ලැබෙන ඉල්ලීම් මත නිරීක්ෂණයන්හි සඳහන් වියදම් දරා ඇති බැවින් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලදි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ පවුල්වල සාමාජික සුභසාධනය සැලසීමේ අරමුණින් 2010 වර්ෂයේ දී රු.මිලියන 5 ක් ආයෝජනය කිරීමෙන් ආරම්භ කර මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන බුදුපුත් මාපිය උපහාර භාරය පිහිටුවා තිබුණ ද, ආයෝජිත මුදලින් ලැබෙන පොලියෙන් ඉටු කළ හැකි අරමුණු හඳුනාගෙන ඒ බව ලිඛිතව මහාභාරකාරවරයා වෙත දැන්වීමට කටයුතු කර නොතිබුණි. | ලැබෙන පොලි මුදල ඉතා සුළු බැවින් වෙනත් අරමුණු කෙරෙහි අවධානය යොමු නොකරන ලදි. | භාරය පිහිටුවීමේ අරමුණ අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | දහම් පාසල් ගුරුවරුන්ගේ හදවත් සැත්කම් සඳහා රු.මිලියන 2 ක් ආධාර ලබා දීමටත්, රු.මිලියන 3 ක් උපයෝගී කර ගෙන ලක්ෂ 02 ක් බැගින් බුදුපුත් මාපිය උපහාර නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණ ද ඒ සඳහා වැය කළ මුදල පිළිවෙලින් රු.925,000 ක් හා රු.500,000 ක් වීමෙන් එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 46.25 ක් හා සියයට 16.67 ක් විය. | දැනට ලැබෙන ඉල්ලීම් මත නිරීක්ෂණයන්හි සඳහන් වියදම් දරා ඇති බැවින් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර ඇති වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලදි. | ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර ඇති වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු වේ. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු.57,183,750ක් ද, ඊට අදාළව සමාලෝචිත වර්ෂයේ පොලිය රු.10.265,513 ක් ද වූ නමුත් 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 03 ඡේදය ප්‍රකාරව අරමුදලට අදාළ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ වැය කළ මුදල රු.2,600,179 ක් පමණක් විය. අරමුදල් කාර්යක්ෂමව යොදාගනිමින් අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර ආයෝජනය කරමින් පැවතීම මීට හේතුව බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී විධායක සභාවේදී හා මහා සභාවේදී මේ සම්බන්ධව සාකච්ඡා කර අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අරමුදල කාර්යක්ෂව යෙදවීමට සුදුසු වැඩ පිලිවෙලක් සැකසීමට කටයුතු කරමි. දැනට ද අරමුදලෙහි අරමුණු වලට අනුකූලව ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන වෛද්‍ය ආධාර, බුදුපුත් නිවාස අධාර ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලැබේ. | අරමුදල් කාර්යක්ෂමව යොදාගනිමින් අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 38(ඊ) සහ 40 වගන්ති ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයක ගණන් දීමේ නිලධරයා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් හෝ අරමුදලේ කටයුතු පිළිබඳව විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | නව විධායක මණ්ඩලය දැනුවත් කරන ලද අතර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් විගණනයක් සිදු කර ගැනීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සමග සාකච්ඡා කිරීමට සටහන් කර ගතිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 877 (1) (ඇ) අනුව කිසියම් මුදල් වර්ෂයක් සඳහා අනුමත කරන ලද අයවැයකින් තොරව අරමුදල යටතේ කිසිදු වියදමක් දැරිය නොහැකි වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර නොතිබුණි. | ඇමතිතුමා විසින් අනුමත කරන ලද අයවැය, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2022.12.01 දින ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව අයවැය අධ්‍යක්ෂ ජනරාල් මගින් විමසිමට කටයුතු කරමි. | අනුමත කරන ලද අයවැයකින් තොරව අරමුදල යටතේ කිසිදු වියදමක් දැරිය නොහැකි බැවින් අයවැය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |